# ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**තුෂාණි සංදීපනී මාටින්**


## Abstract

ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරයේ පිහිටි දිවයිනකි. මෙබිම අනර්ඝ වූ සුවිශේෂී ඛණිජ සම්පත්වලින් පරිපූර්ණය. එමෙන්ම, ඉතා පැරණි සංස්කෘතික උරුමයන්ගෙන් පොහොසත්ය. ලංකාවේ සාම්ප්‍රදායික මැණික් කර්මාන්තය දීර්ඝ ඉතිහාසයකට උරුමකම් දක්වයි. අනාදිමත් කාලයක සිට මැණික් කර්මාන්තයේ යෙදුණු පුද්ගලයෝ විවිධ වත්පිළිවෙත්වල යෙදුනහ. එකී වත්පිළිවෙත්වලට පාදක වූයේ මනසේ ගොඩනැගුණු ඇදහිලි පද්ධතියකි. ඒ අනුව මැණික් කර්මාන්තය හා සබැඳි ඇදහිලි හා විශ්වාස ඉතිහාසය තුළින් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම වැදගත්ය. මෙම පර්යේෂණයේ ගැටළුව වන්නේ ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස වර්තමානයේ ද එලෙසින්ම පවතින්නේ දැයි විමසීමය. එහිදී මැණික් කර්මාන්තය හා බැඳි අභිචාර අධ්‍යයනය කිරීම හා වර්තමානයේ ප්‍රධාන වානිජ ව්‍යාපාරයක් වූ මැණික් කර්මාන්තයේ මෙම අභිචාරවල නව ප්‍රවණතා අධ්‍යයනය කිරීම ද අරමුණය. මෙම පර්යේෂණයේ මූලික ක්‍රමවේද දෙකකි. පළමුවැන්න ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ අන්තර්ගතවන පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදයයි. එහිදී පොත්පත්, ලිපි ලේඛන මෙන්ම ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් පෞරාණික හා කාලීන ලේඛන ද අධ්‍යයන කළේය. දෙවැන්න කේෂේත්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෙමාසික ක්ෂේත්‍ර පර්යේෂණයක් සබරගමු පළාතේ පැල්මඩුල්ල, රත්නපුරය, හා ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරින් සිදුකළේය. එහිදී තෝරාගත් ඉලක්කගත පුද්ගලයන් හා කණ්ඩායම්ගේ සහභාගීත්වයෙන්, සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කරුණු එක්තැන් කළේය. ඒ අනුව එම ප්‍රදේශ ආශ්‍රයෙන් එකිනෙකට වෙනස් ඇදහිලි හා විශ්වාස කිහිපයක් මූලිකව හඳුනා ගැනුනි. එහිදී **දෙවියන් උදෙසා භාරවීම, ජන්ම පත්‍රය පරීක්ෂා කරවා ගැනීම, බුදුන් ප්‍රමුඛ සතර වරම් දෙවියන්ට පහන් දැල්වීම, සාත්තර, ජේන හෝ අංජනම් එළි බැලීම, ජ්‍යොතිෂ අනුව මැණික් භාවිතය** ආදී අභිචාර වීය. සමස්තයක් වශයෙන් මැණික් කර්මාන්තය දැඩි පරිශ්‍රමයක්, කැපකිරීමක් කරමින් සිදුකෙරේ. ඒ අනුව මැණික් කර්මාන්තයේ නිරතවූවන්ට විවිධ වූ බලවේගවලට මුහුණ දීමටත්, එම බලවේගයන්ගෙන් ආරක්ෂා වීම උදෙසා එයටම ආවේණික ඇදහිලි හා විශ්වාසවල නිරත වීය. එසේම වර්තමානයේ නවීන තාක්ෂණය හා වානිජකරණය හමුවේ මෙම අභිචාර විවිධ වෙනස්කම්වලට ලක්වෙමින් මේ දක්වාම පැවතේ. පූර්වෝක්ත කරුණු අනුව මැණික් කර්මාන්තය හා සැබැඳුණු අභිචාර විධි සර්වකාලීනව පැවතිය යුතු බව පැවසිය යුතුය.



**ප්‍රමුඛ පද**

ඇදහිලි හා විශ්වාස, ඛණිජ සම්පත, නවීන තාක්ෂණය, මැණික් කර්මාන්තය, වානිජ ව්‍යාපාරය


## හැඳින්වීම

මෙම පර්යේෂණයට අනුව ශ්‍රී ලංකාවේ මැණික් සම්පත දුරාතීතයට උරුමකම් කියන්නා වූ ඓතිහාසික වටිනාකමක් ඇති ඛණිජ සම්පතකි. සබරගමු පළාත භාරව වැඩ හිඳින **සුමන සමන් දෙවියන්** පිදීම සෑම සබරගමු වැසියෙකුගේ ම එදිනෙදා ජීවිතයේ කාර්යයකි. මැණික් කර්මාන්තයේ ද වන්දනාමාන ලබන්නා වු දෙවිවරුන් රාශියකි. ඒ අතරින් සමන් දෙවියන්ට හිමි වනුයේ සුවිශේෂි ස්ථානයකි. **“සුමන සමන් දෙවි පිහිටෙන් අපේ වැඩේ හරියාවි”** යන බලාපොරොත්තුව යහපත් කාර්යයන් කිරීමට යන හැම අවස්ථාවකට මුවට නැගෙන වචනයකි. ඒ අනුව මැණික් කර්මාන්තයේ දී අනුගමනය කරනු ලබන ඇදහිලි හා විශ්වාස ක්‍රම අතුරින් කිහිපයක් පහත සඳහන් ය.

### 1. දෙවියන් උදෙසා භාරවීම

අතීත මුතුන්මිත්තන් සුභ කර්තව්‍යයක් කිරීමට පෙර දෙවි කෙනෙකු ඉදිරියට ගොස් භාරයක් භාරයක් වීම දක්නට ලැබෙයි. ලංකාවට බෞද්ධ ආගම ඒමට පෙර මෙරටට හින්දු ආගමේ බලපෑම ලැබුණ අතර, එම හින්දු සංස්කෘතියේ බලපෑම උඩ මෙම චාරිත්‍රයන් - විශ්වාසයන් ඇති වු බව පෙනී යයි.

මැණික් කර්මාන්තයේ දී මෙම භාර වීම සුලභව දක්නට ඇති චාරිත්‍රයකි. සමන් දෙවියන්ට, කතරගම දෙවියන්ට මෙම පඬුරු ගැටගැසීම් කරන අතර මහා සමන් දේවාලය වෙතට යන පතල් කරුවන් තමාගේ පතලේ කාර්යය සාර්ථක කර දෙන ලෙස ඉල්ලා පඬුරු ගැටගසා භාරවීම කරයි. එසේම රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති දේවාලවල, කතරගම දෙවියන්ට පුද පූජා පවත්වන තැන්වලට ගොස් පඬුරු ගැට ගසා තමාගේ පතලේ කාර්යයන් සාර්ථකව කරදරයක් නැතිව කර ගැනීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටී. මෙම පඬුරු ගැටගසා ගැනීමට පෙර මල් පහන් පුදා බුදුන් වැද පැමිණ කපුමහතා ලවා යාතිකාවක් කර පඬුරු ගැට ගැසීම කරයි. තමාගේ පතලෙන් වටිනා මැණික් හමු වූ පසු භාරය ඔප්පුකරන බවට පොරොන්දු වී පඬුරු ගැටගැසීම කරයි. තම තමන්ට හැකි පමණින් විවිධ වස්තූන් භාරය සඳහා දීමට පොරොන්දුවෙයි. සෑම භාරයක්ම නිදහස් කිරීමේ දී පූජා වට්ටියක් දීම කරනු ලැබේ. පූජා වට්ටිය ඉස්තරම් අන්දමින් දීමට පතල්කරුවෝ කටයුතු කරන්නේ තමාට ලැබුන වාසියක් සමඟ ය. බටපොතු වට්ටියකට, ඇළුමිනියම් පිගානකට බුලත් අසුරා, පළතුරු හයක්, කැවිලි හයක්, පඬුරු ආදිය ඒ මත තබා රතු, නිල්, සුදු ආදී වර්ණවලින් ඒ ඒ දෙවියාට අයත් වර්ණයෙන් එක් මාලයක් තබා පූජා වට්ටියක් සකස් කරනු ලබන අතර, ඔවුන් භාරවීමේ දී පොරොන්දු වූ වෙනත් ද්‍රව්‍යයක් තිබෙනවා නම් එවාත් සමඟ ම රැගෙන ගොස් බුදුන් වැද, දෙවියන්ට භාරය ඔප්පු කිරීම කරයි. මෙහි දී කපු මහත්තයා විසින් සියළු පිරිසටම යාතිකා කිරීම දක්නට ලැබෙන අතර, පතලේ හවුල් කරුවන් සියළු දෙනා මේ සඳහා සහභාගි වනු දක්නට ලැබේ. භාරභාර විමේ දී පොරොන්දු වන ද්‍රව්‍ය විවිධාකාරයක් ගනු ලබන අතර, තම ආර්ථික මට්ටමට අනුව එහි ප්‍රමාණය තිරණය වේ.

1. පිත්තල පහනක් පූජා කිරීම.
2. දේව ප්‍රතිමාවක් හෝ දේවරූපයක් පූජා කිරීම.
3. තිර රෙද්දක් පිදීම - මෙහි දී භාරය වන දෙවියන්ගේ පාටට අනුව තිර රෙද්ද පූජා කරයි. උදාහරණ -: කතරගම දෙවියන්ට භාරභාරවූ විට රතුපාට තිර රෙද්දක් පූජා කරයි.
4. ආලෝක පූජාවන් පැවැත්වීම.
5. සිරිපා වන්දනාවට, අටමස්තානේ වන්දනාවට, කතරගම වන්දනාවට පිරිසක් එක් කර ගෙන යන බව පොරොන්දු වීම.
6. දානමාන දීමට පොරොන්දුවීම

ආදී භාර භාරයන් වෙයි.[1]

කතරගම දෙවියන්ට භාර වීම මැණික් කර්මාන්තයේ දී සුලභව දක්නට ලැබෙන අතර එවිට භාර නිදහස් කිරීමට කතරගම මහා දේවාලයට පැමිණෙන ඔවුන් පූජා වට්ටියක් සහිතව භාර වුන දේ පූජා කරයි. මෙම භාරභාර වීම් අතීතයේ පවා තිබූ බවට සාක්ෂි පවතී. දඹදෙණි යුගයේ දී දෙවැනි පැරකුම්බා රජුගේ මහ ඇමති වූ **ආර්ය කාමදේව** ඇමති මැණික් ගැරීම සඳහා සබරගමු පළාතට ගිය අතර එහි දී තමාට වටිනා මැණික් ලැබුන හොත් සමන් දෙවියන් උදෙසා තෙමහල් ප්‍රාසාදයක් තනාදෙන බවට පොරොන්දු වී භාරයක් විය. සබරගමුවේ දී ඔහුට ඉතා වටිනා මැණික් ලැබුණ නිසා නැවත පැමිණි ඔහු සමන් දෙවියන්ට ප්‍රාසාදය සාදා දුන් බව සඳහන් වේ. සමන් සිරිතේ කවි වල ද ඒ ගැන සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| සුරිඳුනි සිරිබර | - | අප මිණි කම් කරන | වර |
| ලදුවොත් මිණි පවර | - | ගෙයක් කරවමි තුන් මහල් | කර |

පතල් කැණීමට ප්‍රථමව පතලයේ හවුල්කරුවන් සියළු දෙනා සහභාගි වී කරන මෙම භාරභාර විම් පතලේ ඉල්ලම් ගැරීමට ප්‍රථමව ද කරනු දක්නට ලැබේ. ඉල්ලම් ගැරීමේ දී මැණික් හමුනොවේ නම් ඉල්ලම් ගැරීම නවතා ඔවුන්ගෙන් කිහිපදෙනෙකු සමන් දේවාලයට ගොස් පඬුරක් ගැට ගසා පැමිණ නැවතත් ඉල්ලම් ගැරීම කරයි. එවිට මැණික් හමු නොවූ ගැරුම් වට්ටියෙන් මැණික් හමුවන අවස්ථා ඇත. මැණික් හමු වූ පසු එම ගල විකිණීමට ගිය විට එහි නියම වටිනාකමට මිලක් නොලැබෙනවා නම් එවැනි අවස්ථාවල දී ද සමන් දේවාලයට යන ගලේ හිමිකරුවන් සමන් දෙවියන්ට භාරභාරවිම් ද කරයි. ගල විකුණු පසු භාරභාර සඳහා පළමු මුදල් කොටස වෙන් කිරීම විකුණුම් කරුවන්ගේ සිරිතය. මෙලෙස භාරභාර විම් වූ විට පතලේ සෑම කටයුත්තක දීම ඉල්ලම් ගැඹුරේ ඇති විට, ඉල්ලම් ගැරීමේ දී ගලක් හමු නොවන විට ආදී අවස්ථා වල දී **"අනේ බං සමන් දෙවියන්ට ගල් එපාද?", "කතරගම යන්න වෙනෙකක් නැද්ද", "මේ පාරවත් සිරිපාදේ යන්න පුළුවන් වුනොත්", " බුදුන්ගේ සරණයි, සමන් දෙවියන්ගේ පිහිටයි ආරක්ෂාවයි"** වැනි වචන භාවිත කරයි. එහි දී සිදු වනුයේ තමා විසින් වුන භාරය හැම වේලාවෙම සිහි කිරීමෙන් තමාගේ බලාපොරොත්තුව සඵල වේය යන විශ්වාසයයි.

[1] රාජපක්ෂ, ශ්‍රියාණී. මැණික් කර්මාන්තය හා බැඳි වත් පිළිවෙත්. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2003, 34 පිටුව.

## 2. ජන්ම පත්‍රය පරීක්ෂා කරවා ගැනීම

පතලයක වැඩ ඇරඹීමට ප්‍රථමව භාරහාර ආදිය වී පැමිණි පතලේ හිමිකරුවා තම හඳහන නැතිනම් ජන්ම පත්‍රය ජ්‍යොතිෂයවේදියකු ලවා පරීක්ෂා කරවා ගැනීම කරයි. ග්‍රහදෝෂ අනුව තමාට ධනලාභ, භූමි ලාභ තිබේ ද නැද්ද යන්න බලවා ගෙන පතල ආරම්භය සඳහා සුභ වේලාවක් බලාගැනීම කරයි. තමාට යම් කිසි අපල උපද්‍රවයක් තිබේ නම් ඒ ගැන දැනගෙන ඒ සඳහා සුදුසු පූජා කර්ම කිරීම අභිප්‍රේරිත අරමුණයි. දෛවය අනුව සියල්ල සිදුවෙතැයි සිතන මනුස්ස සංහතියේ එම ක්‍රියාව නිසා දෛවය විසින් තමාව පොහොසතෙක් හෝ දුප්පතෙක් කර විය හැකි යන බලාපොරොත්තුව විශ්වාසය පවති. පතලේ සෑම කටයුත්තක්ම සිදුවනුයේ මෙලෙස ජන්ම පත්‍රය බලා සාදාගනු ලබන සුභ හෝරාවකට නැතිනම් සුභ නැකැත් වේලාවකට අනුගතව ය. පතල ලකුණු කිරීම, පතලේ පළමු පස් පිඩැල්ල කැපීම, ඉල්ලම් කැඩීම, ඉල්ලම් ගැරීම, මැණික් විකිණීම ආදී සෑම කර්තව්‍යයක්ම සුභ හෝරාවක කරනු ලැබේ. ජන්ම පත්‍රය බලන ජ්‍යොතිෂයවේදියා එම නැකතට හිමි සුභ දිශාවක් ද ඒ සමඟ ලබා දෙයි. මෙලෙස සුභ හෝරාවෙන් සුභ දිශාව බලා වැඩ කිරීම තුළින් තම කාර්යය සාර්ථකව කරගත හැකි ය යන විශ්වාසය පතල් හිමියන් තුල පවති.

## 3. බුදුන් ප්‍රමුඛ සතර වරම් දෙවියන්ට පහන් දැල්වීම

පතල ආරම්භයේ සිට පතලේ වැඩ අවසන් වන තුරු පතල් භූමියේ පසෙකින් තනන ලද මල් පැලක බුදුන්ට හා දෙවියන්ට පහන් දැල්වීම කරන අතර ආරම්භක දිනයේ පතල් සීමා ලකුණු කළ පසු සිවුකොණ සාදන ලද මල් පැල් හතරක පහන් දැල්වීම කරයි. එය ඇතැම් පළාත්වල පතලේ දෛනිකව දල්වනු ලබන පහනක් දක්නට ලැබෙන අතර එම පහන ගලකින් නිමවන ලද්දකි. පතලේ වැඩ අරඹන සෑම දිනකම එම ගල් පහනට වැද නමස්කාර කර වැඩ ඇරඹීම පතල් කරුවන්ගේ සිරිතකි. ඉල්ලම් කඩා ගත් පසු ඉල්ලම් කමත මත ඉල්ලම් මුදුනේ දල්වන එවැනිම ගල් පහනක් සමහර පළාත්වල දක්නට ලැබේ. ඉල්ලම් ගරන අවස්ථාවේ දී මැණික් නොලැබෙන විට පහනක් දැල්වීම කරන අතර ඒ සඳහා **රත්න චාමුන්ඩය මන්ත්‍රයෙන්** හෝ **රාජගිංගිලියාව මන්ත්‍රයෙන්** ජීවත් කරන ලද තැබිලි තෙල් යොදා ගනි.[2]

## 4. සාත්තර, ජේන හෝ අංජනම් එළි බැළීම

මෙම කර්තව්‍යයන් ත්‍රිත්වය අතර යම්තාක් දුරක සාමාන්‍යතාවයක් සේම අසාමාන්‍යතාවයක් ද දිස්වෙයි. අදෘශ්‍යමාන බලවේග ගැන විශ්වාස කරන අපේ මුතුන්මිත්තන්ගේ කාලයේ පටන් අංජනම් එළි බැලීම්, ජේන බැලීම්, සාස්තර බැලීම් ආදිය තිබුණි. තමාට වෙනත් පාර්ශවයකින් සිදුවන්නා වූ අනතුරු අන්තරා කරදර බාධක හදි හූනියම් අණවින කොඩිවින පිළිබඳව දැනගැනීම සඳහා මෙම ක්‍රම උපයෝගි කර ගත්හ. මෙය ගුප්ත විද්‍යාවට අයත් වන අතර හින්දු ආගමික බලපෑම් ඔස්සේ මෙරටට පැමිණියහ. පතලක් ආරම්භ කිරීමට පෙර මැණික් ඉල්ලම් සහිත ප්‍රදේශ සොයා ගැනීම් සඳහා මෙම ක්‍රමෝපායන් යොදා ගත් අතර පතලේ වැඩ කිරීමේ දී අතර මඟ සිදුවන අතුරු ආන්තරාවන්හි නිමක් නොමැති විට ද මෙම සාත්තර බැලීම්, ජේන බැලීම් අංජනම් එළි බැලීම් වල පතල් කරුවන් නියැලුනහ. මල් බුලත් තටුවක් සාදා ඒ මත විශේෂ ආකාරයට සාදන ලද තැටියක් වැනි දෙයක් ඉදිරියේ තබා පහන් ආලෝකයෙන් බලා යම් කිසි දෙයක් පැවසීම කරනු ලබන අතර මෙහි දී එය කියන පුද්ගලයා ආරූඪ වීමක් හෝ නොවීමක් දක්නට ලැබේ.

මැණික් කර්මාන්තය හා සමඟ බැඳි ඇදහිලි විශ්වාස ගෙන බැලීමේ දී රත්නපුර පතල් කරුවන් අතර තිබෙන විශ්වාසයකි, ශ්‍රී පාද සමය ආරම්භ වීමත් සමඟ වැඩිපුර මැණික් ලැබේ ය යන්න ය. ඊට හේතුව ලෙස ඔවුන් දක්වන්නේ සුමන සමන් දෙවියන් මැණික් ලබා දෙන බව ය. උන්වහන්සේ වැද පුදා ගැනීම උදෙසා ම මිනිසුන්ට ධනය ලබාදීමට සේම තමාගේ අණසකයකට නතුවන, වැඩිහිදින, සබරගමු පළාතේ පොළොා ගැබෙන් අහිංසක ජනතාවට මිණිකැටයක් ලබා දී, සමන්ත කූඨය වන්දනා කර වන බවට සබරගමු වැඩිහිටියන්ගේ විශ්වාසයක් පවතී.

රතුකැට, නිල්කැට, ගෝමේද ආදී විවිධ වර්ගයේ මැණික් ලබාගැනීම උදෙසා එම මැණික් වර්ගයට අදිගෘහිත දෙවියන්ට පුදපූජා පැවැත්විය යුතු බවටත් පහන් දැල්වීම කළයුතු බවටත් විශ්වාසයක් පතල් කරුවන් තුල පවති. එහි දී රතු කැටයක් ලබා ගැනීම උදෙසා කතරගම දෙවියන්ට පූජෝපහාර දැක්විය

---

[2] *රාජපක්ෂ, ශ්‍රියාණි. මැණික් කර්මාන්තය හා බැඳි වත් පිළිවෙත්. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2003, 38 පිටුව.*

යුතු බවත්, විෂ්ණු දෙවියන්ට පුද පෙත් ලබා දීමෙන් නිල්කැට ලබාගත හැකි බවටත් ඔවුන්ගේ විශ්වාසයයි.

පොළව ආශ්‍රිත කර්මාන්තයන්හි දී එයට අධිශෘහිත **පොළෝ මහීකාන්තාව** ගෙන් වරම් යැදීම කළ යුතු ය. මැණික් සම්පත පිළිබඳ පොළෝ මහීකාන්තාවට අධිගෘහිත වන්නේ **මංගර දෙවියන් වහන්සේ ය.** මංගර දෙවියන් වෙනුවෙන් සබරගමු පළාත තුළ දේවාල රාශියක් ඉදිකර ඇති අතර ප්‍රධාන දේවාලයක් බලංගොඩ, රජවක නම් ප්‍රදේශයේ ඉදිකර ඇත. මේවායේ වාර්ෂිකව මඩු තෝත්‍ර පවත්වමින් මංගර දෙවි ප්‍රධාන දේව සමූහයාට පුද පූජා ලබාදීම සිදු කරයි. මංගර දෙවියන් මැණික් සම්පත ලබා දෙන අතර මැණික් වලට අධිගෘහිත දෙවියෝ ලෙස ඇතැම් ප්‍රදේශ වල පුද පූජා පවත්වයි. ඒ ඒ ප්‍රදේශයන්හි පතල් කැපීමට ප්‍රථමයෙන් මංගර දෙවියන් උදෙසා පූජාවක් ලබා දෙන අතර උන්වහන්සේගේ නමින් පඬුරු වෙන් කිරීමක් සිදුකරයි.

සබරගමු පළාත තුළ මැණික් වලට අධිගෘහිත දෙවි කෙනෙක් ලෙස සලකන මැණික් බණ්ඩාර දෙවියන් වහන්සේ බණ්ඩාර දෙවිවරුන්ගෙන් එක දෙවි කෙනෙකු ලෙස පුද පෙත් ලබයි. බණ්ඩාර දෙවි කට්ටුවේ දී උන්වහන්සේ හඳුන්වන්නේ **"රත්නපුරේ මැණික් බණ්ඩාර දෙවියන්"** ලෙසට ය. **"මැණික් රජා"** යන අනුවර්තන නාමය ද මෙම දෙවියන් වෙනුවෙන් යෙදී ඇත්තේ මැණික් වලට උන්වහන්සේගේ ඇති බලපරාක්‍රමය හේතුවෙනි. මැණික් බණ්ඩාර දෙවියන් මැණිකක් සුරතට ගෙන සිටින අතර වැඩ හිඳින සයනේ මැණික් අල්ලා අලංකාර කර ඇත. උන්වහන්සේ ගැන කියවෙන ඇතැම් පද්‍ය වල දී උන්වහන්සේ හා මැණික් අතර තිබෙන්නා වු බැඳීම මොනවට පැහැදිලි වෙයි.

| | |
|---|---|
| මැණිකක් සොරකම් කර | පුලුවන්දිය |
| සොරකම් නොකළොත් හෙමවෙයි | වන්දිය |
| රිදීමකාලා බුබුලු පැලැ | න්දිය |
| මැණික් රජා අල්ලෙන් රන් | බෙන්දිය |
| | |
| රිදියෙන් පාරුත් ගෙයි | ඇවිලෙනවා |
| සයනේ මැණිකක් ධජ | දිලිසෙනවා |
| ඒ දැක සෑම දෙවි වාදෙට | සිටිනවා |
| මැණික් රාජානන් මෙන්න | වඩිනවා |
| | |
| මැණික් කොතට බැඳි ලෙසට | විපුලලා |
| සොවින් අතට එහරණ | දැනගල්ලා |
| වෙනත් යකුන් දෙස නොබල | සියල්ලා |
| මැණික් රාජාවැඳ ගන්නු | සියල්ලා |
| | |
| මැණික් ගඟට දෙවි වැඩම | කරන්නේ |
| මැණික් ගරා පුටුවේ වැඩ | ඉන්නේ |
| මැණික් බැඳපු රන් වේවැල් | ගන්නේ |
| මැණික් රජානන් සයනේ | වඩින්නේ |

### 5. ජ්‍යොතිෂ විද්‍යාව හා මැණික් භාවිතය

රවි, සඳු, බුධ, ශුක්‍ර, ශනි, රහු, කේතු ආදී නවග්‍රහයන් ලග්න 12 ඇසුරු කර ගනිමින් දිනය, නැකැත, තිථිය, යෝගය, කරණය යන පංචාංගය ද යා කෙරෙන ලොව මිනිසාට සලසන මෙහෙවර අප්‍රමාණය. යම්කිසි කෙනෙකු පෙර ආත්මයේ කරන ලද්දා වු කුසලාකුසල කර්ම ප්‍රතිවිපාක මත උපදින වේලාවේ ඉහත තරංග ශක්තීන් හිරු, සඳු මුල් කරගෙන ජීවිතවලට එකිනෙකට වෙනස් බලපෑම් ඇති කරයි. කුමන රටක, කුමන ජාතියකට අයත්ව මේ පොළව මත උපත ලැබුව ද ඔවුන් උපත ලබන වෙලාවට

විශ්ව ආකර්ශණය ඇති කේන්ද්‍රයක් නිතැතින් ම හිමි වේ. කලලයේ සිට මරණය දක්වා අතීත, අනාගත භවයන් පිළිබඳ තොරතුරු නිවැරදිව පැවසිය හැකි ශාස්ත්‍රීය ක්‍රමවේදය ජ්‍යොතිෂ විද්‍යාව තුළ ඇති අතර, ඒ වනාහී නොපෙනන ඇස නොහොත් පියවි ඇසට නොපෙනෙන කරුණු නුවණින් හඳුනා ගැනීමේ ශාස්ත්‍රයකි.

ජ්‍යොතිෂය බ්‍රාහ්මණයින් විසින් දේශිත දේශනාවක් බවත් තවත් ලෙසකට එය ශිව හෝ ඉන්ද්‍ර දෙවියන් දේශනා කළ බවත් සඳහන් වේ. හින්දු ආගමට අයත් වේදාංගයක් වන ජ්‍යොතිර් විද්‍යාව, අෂ්ඨාංග සමන්විත ආයුර්වේදයේ කොටසක් ලෙස ද දැක්වේ. සප්ත ඍෂිවරුන් දෙවියන් වෙතින් ජ්‍යොතිෂය, ආයුර්වේදයේ ඉගෙන ගෙන සකල ලෝක සත්ත්වයාගේ යහපත පිණිස දේශනා කළ බව සංස්කෘත ග්‍රන්ථ වල අදහසයි. **පරාශර ඍෂි** විසින් දේශිත **බෘහත් පරාශර සිද්ධාන්ත** අනුව අප දැනට භාවිත කරන ජ්‍යොතිෂය හා ආයුර්වේදය ගොඩනැගී ඇති අතර, ඉන්දියාවේ බ්‍රාහ්මණ පරම්පරාවෙන් එය ආරක්ෂා කර ගෙන පැමිණ ඇත. බුදුන් කාලයේ දී මෙවැනි දෛවඥයින් සිට ඇති බවට බුද්ධ චරිතය ආශ්‍රයෙන් තොරතුරු සඳහන් තැන් වල දක්නට ලැබේ. මෙම විෂය මුළුමනින්ම අනාවැකි මත පදනම් වූවක් වන අතර, උතුම් වූත් ලොවම අතිශයින් ප්‍රයෝජනවත් වූත් ඉතාම ගැඹුරු වූත් මහඟු ශාස්ත්‍රයක් වෙයි. ජ්‍යොතිශයේ ආරම්භය වේදයන්ගේ ආරම්භය සමඟ සිදු වූ අතර, වේදය ආරම්භ වූ වකවානුව පිළිබඳව නිශ්චිතව සඳහන් නොවේ. මෙසේ බලන කල අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් ජ්‍යොතිෂයට හිමි වෙයි. කෙසේ වෙතත් ජ්‍යොතිෂය යනු අන් කිසිවක් නොව සාම්ප්‍රදායික ඥානය විසින් සූත්‍ර ගත කරන ලද සම්පිණ්ඩනය කළ සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ ඥාණයයි. වර්තමානයේ ලෝකයේ ප්‍රබල ලෙස කතාබහට ලක්වන මාතෘකාවන් වන ජ්‍යොතිෂයට ලෝකයේ ව්‍යාප්තව පවතින විද්‍යාවන් අතර ප්‍රමුඛ ස්ථානයක් හිමි වේ. ජ්‍යොතිෂය ගුප්ත විද්‍යාවක් ලෙස ද අර්ථකථනය කිරීමක් කළ හැකි ය.

අනාගතයේ සිදුවිය හැකි දේ කල්තියා දැනගෙන එයට සාර්ථකව මුහුණ දීමට සූදානම් වීම ජ්‍යොතිෂයේ මූලික පරමාර්ථයක් වන අතර, මෙය කළ හැකි වෙනත් විද්‍යාවක් හෝ ශාස්ත්‍රයක් මිනිසා සතුව නොමැති බැවින් ජ්‍යොතිෂයට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. එහි පදනමේ සිට අන්තර්ගතය දක්වා ම තර්කයෙන් හෝ පරීක්ෂණයෙන් ඔප්පු කළ නොහැකි කරුණු වලින් පිරී පවතී. මේ නිසා මිනිසුන්ගේ සිත් සතන් තුළ ඒ පිළිබඳ පවතින්නා වූ ගෞරවාන්විත විශ්වාසය ඉතා විශිෂ්ඨ වන්නේ ය.

ඒ නිසාවෙන් ම මැණික් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයින් ද ජ්‍යොතිෂය පිළිබඳව විශ්වාසනීයත්වයෙන් යුතුව කටයුතු කරයි. ඊට අමතරව ජ්‍යොතිෂය සමඟ ම ප්‍රබල ලෙස මැණික් ගලේ බැඳීමක් පවතී. ග්‍රහයන්, නැකැත්, වර්ෂ, මාස, දින, රාශි හැම එකක් සමඟ ම මැණික් ගල් සම්බන්ධ වේ. අතීතයේ ජ්‍යොතිෂය ආරක්ෂා කරන ලද ඍෂිවරුන් විසින් ඒ ඒ ග්‍රහයන් සඳහා අයත් ගල් නිර්දේශ කර ඇත.

එම ගල් පැළඳි විට ග්‍රහයාගේ බලය, ගුණය ලැබේ යැයි විශ්වාස කළේය. මැණික් ගල් වලින් වර්ණ, භූත, දිශා ආදී බලයන් ඇති කරයි.

එක් එක් ග්‍රහයන්ට අයත් නියමිත මැණික් ගැන ඍෂිවරුන් පවසා ඇති ආකාරයට නවරත්න මැණික් පැළඳීම පිළිබඳව දැක්වෙන ශ්ලෝකයක් පහත දැක්වේ.

මාණික්‍යං කරණෙමර්ධ්‍යෙ ප්‍රච්‍යං වජ්‍රං භෘගෙර්වධො ඃ

ආගේන්‍යයං මෞකතිකං යාම්‍යාං ප්‍රවලං මංගස්‍යච

ගෝමේද රක්‍ෂයේ රාහෙ ඃ පශ්චිමේ නංලකං ශචං ඃ

වායෞ වෛඩූය්‍යර්කං කෙතෝ රුදිච්‍යාං පුෂ්පකං කුරෙ ඃ

ගාරුත්මතං තපේ ශාන්‍යාං සෝම පුත්‍රස්‍ය තුෂ්ඨයේ

මුදිකායනං නරෙධ්‍යායය්‍යං ග්‍රහාණං ප්‍රීතයේ සදං

ඔවුන්ගේ අදහසට අනුව රත්තරන් මුද්දක මුදුන ගෝලාකාර කොටස් 09කට බෙදා පූර්ව දිශාවේ ග්‍රහයින්ට අයත් ගල් අල්ලා ගැනීම කළ යුතු බවත්, එසේ නිවැරදිව ගල් අල්ලා ගැනීමෙන් ග්‍රහයින් සතුටු වන බවත් ය. මැණික් පැලඳීමේ දී දත යුතු කරුණු බොහෝ ය. මැණික් කැපීමේ දී වැරදි ක්‍රමයට කැපූ ගල් පැළඳීම අශුභ ඵල ලැබීමට හේතුවක් වන්නේ ය. නිවැරදි ග්‍රහයාට පළඳින ගලක් වූව ද වැරදියට කැපී තිබුණොත් එහි ප්‍රතිඵල අයහපත් වේ. ග්‍රහ අපලයක දී අදාල ග්‍රහයාගේ කිරණ වැඩිපුර ලබා ගැනීම සඳහා දිලිසීමක් ඇති නොවන පරිදි ගල කැපිය යුතු අතර, එම ගල ශරීරයේ ස්පර්ශ වන ලෙස පැළඳීම තුළින් ගලේ ඇති රසායනික ද්‍රව්‍ය ශරීරයට උරා ගැනීමට ඉඩ සලස්වා ගලේ ඇති බලය පුද්ගලයාට ලබා දීමට කටයුතු කරයි. නමුත් ඇතැම් විෂ සහිත ගල් වලින් ශරීරයට හානි වීමත් විවිධ රෝගාබාධ සෑදීමත් සිදු විය හැකි ය.

ග්‍රහයන්ගේ ග්‍රහ මණ්ඩල වලට අයත් ඇඟිලි වලට ගල පැළඳීමෙන් වඩාත් සුභ ඵල ලබා ගත හැකි ය. මෙය ගල් දෙකක් පැළඳීමේ දී සැලකිය යුතු ය. එවිට එම ග්‍රහයන් දෙදෙනා මිත්‍ර ග්‍රහයෙකුට අයත් ඇඟිල්ලක මුදුව පැළඳිය යුතු ය.

ලංකාවේ පුද්ගලයෙකුට පැළඳීමට සුදුසු වන්නේ ලංකා භූමියෙන් ම ලබා ගත් මැණික් ගලකි. මුද්දේ නැගෙනහිර දිශාව කිවි ග්‍රහයාට දියමන්තියක් ද, සඳුට ගිණිකොන මුතු ඇටයක් ද, රාහුට නිරිත දිග ගෝමේදයක් ද, කුජට දකුණු දිශාවේ පබළුවක් ද, ශනිට බටහිර නිලක් ද, වයඹදිග කේතුට වෛරළුමිණක් ද, උතුරු දිග ගුරුට පුෂ්පරාගයක් ද, බුධට ඊසාන දිග මරකතක් ද, හිරුට මැද මැණිකක් ද, පළඳී. මේ ගැන සඳහන් ශ්ලෝක පවා ජ්‍යොතිෂයේ සඳහන් වේ.

වජ්‍රං ශුක්‍රෙ චේජ සුමුක්තා ප්‍රවාලං

භෞමේ ගෞමේද මාකෞ සුනීලම්

කෙතෞ වෛදූරයං ගුරෞ පුෂ්පකං ශෙ

පාචිං ප්‍රාධ මාණික්‍යමෙ කෞතු මධ්‍යෙ

නවරත්නයක මැණික් අල්ලන ආකාරය සුවිශේෂීය. මැණික මිනිසාට වාලම්පූරියක් සේම වාසනාව ලබා දෙන්නකි. නවරත්නය පැළඳීම ඕනෑම පුද්ගලයෙකුට කළ හැකි සේම දෛවඥයෙක් හඳහන බලා එහි අපල උපද්‍රව ඇති විට එය දුරු කර ගැනීමට මැණික් ඇල්ලූ ආභරණ පැළඳීමට කියයි. එම සුභ ලබා ගැනීමට ඒවා පළුදු නොවූ මැණික් විය යුතු ය.

### 5.1. <u>උපන් මාසයට අනුව පළඳින මැණික්</u>


- ජනවාරි — රබහ
- පෙබරවාරි — අඹතේස්ත
- මාර්තු — නිල් කිරිංචි
- අප්‍රේල් — දියමන්ති/ සුදු නිල්
- මැයි — පච්ච/ මරකත
- ජුනි — මුතු/ වෛරෝඩි
- ජූලි — රතු
- අගෝස්තු — ජාගුන්
- සැප්තැම්බර් — නිල්
- ඔක්තෝබර් — පුනක්කන්
- නොවැම්බර් — පඬියං
- දෙසැම්බර් — ආරනුල්




රූපාවලිය අංක 01 - උපන් මාසයට අනුව පළඳින මැණික්

5.2. <u>උපන් ලග්නය අනුව පළඳින මැණික්</u>

- මේෂ රතු
- වෘෂභ දියමන්ති/ සුදු නිල්
- මිථුන පච්ච/ මරකත
- කටක මුතු/ චන්ද්‍රකාන්ති
- සිංහ පද්මරාග
- කන්‍යා පච්ච
- තුලා දියමන්ති/ සුදු නිල්
- වෘෂ්චික රතු
- ධනු පුෂ්පරාග
- මකර කාක නිල්
- කුම්භ කාක නිල්
- මීන පුෂ්පරාග




රූපාවලිය අංක 02 - උපන් ලග්නය අනුව පළඳින මැණික්

## 5.3. උපන් සතියේ වර්ණය අනුව පළඳින මැණික්

- ඉරිදා පද්මරාග
- සඳුදා මුතු
- අඟහරුවාදා රතු

- බදාදා පච්ච/ තෝර
- බ්‍රහස්පතින්දා පුෂ්පරාග
- සිකුරාදා සුදු නිල්
- සෙනසුරාදා කාක නිල්



රූපාවලිය අංක 03 - උපන් සතියේ වර්ණය අනුව පළඳින මැණික්

### 5.4. ග්‍රහයින්ට පළඳින මැණික්

- හිරු පද්මරාග
- බුද පච්ච/ තෝර
- අඟහරු රතු කොරල්
- බ්‍රහස්පති පුෂ්පරාග
- සිකුරු දියමන්ති/ සුදු නිල්
- සෙනසුරු කාක නිල්
- සඳු මුතු/ චන්ද්‍රකාන්ති
- රාහු ගෝමේද
- කේතු වෛරෝඩි




**රූපාවලිය අංක 04 -** ග්‍රහයින්ට අනුව පළඳින මැණික්

### 5.5. ජය අංකයට පළඳින මැණික්

1. රතු කොරල්
2. මුතු/ චන්ද්‍රකාන්ති
3. පුෂ්පරාග
4. ගෝමේද
5. දියමන්ති/ සුදු නිල්
6. මරකත/ පච්චතෝර
7. වෛරෝඩි

8. නිල්

9. කොරල්/ පද්මරාග




**රූපාවලිය අංක 05** - ජය අංකයට අනුව පළඳින මැණික්

ජ්‍යොතිෂ විද්‍යාවේ දී ග්‍රහ අපලයන්ට අනුව විවිධ රෝගාබාධයන් සඳහා වෙන් වෙන් වශයෙන් මැණික් වර්ග නම් කර ඇත.

- රූබි - වා, සෙම්, පිත්, තුන් දොස් සමනයට අධික ඌෂ්ණ ශරීර වලට රුධිර වර්ධනයට, ධාතු වර්ධනයට, ක්ෂය රෝගයට, ආහාර මාර්ග රෝග වලට.

- මුතු - ශරීරයේ කැල්සියම් ඌනතාවයට, ක්ෂය රෝගයට, කැස්ස, හුස්ම ගැනීමේ අපහසුතාව, අධික රුධිර පීඩනය.

- කොරල් - ගර්භණී මව්වරුන්ගේ උදරයේ ගැල්වීමෙන් කළල මරණ සිදු විම වැළැක්වීමට ද ආහාර අරුචිය, උණ හා අග්න්‍යාශය ආශ්‍රිත රෝග වලට සුවය ගෙන දේ.

- එමරල්ඩ් - ශරීර උෂ්ණ මේදය වැඩීමට අධික ආම්ලිකතාවය, ඇදුම සමනය කරයි. ආහාර ජීරණය කරයි. හෘද වේදනා සමනය කරයි.
- සුදු පඩියං - කහ උණ, කැස්ස, අතීසාරය, ශ්වසන අවහිරතා මගහරවයි. විෂ කෘමීන් දෂ්ඨ කළ විට එම කුඩු තබයි. වා සෙම් රෝග ද අජීර්ණ රෝග ද සමනය කරයි.

- දියමන්ති - ක්ෂය රෝගය, දියවැඩියාව, රක්තහීනතාවය, හන්දි ඉදිමුම්, බඩවැල් තුවාල සුව කරයි.

➢ සැපයාර්ස් - තද උණ, මීමැස්මොරය, මානසික දුබලතා, හන්දිපත් රුදාව, උදරාබාධ සුව කරයි.

➢ සර්කන් - චර්ම රෝග, පණු රෝග, අතීසාරය වැනි රෝග සඳහා පළඳී.

➢ වෛරෝඩි - කැස්ස, ආහාර අජීරණය, මලබද්ධය, අක්ෂි රෝග සුව කරයි.

➢ තෝරමල්ලි - උණ, ක්ෂය රෝගය, ශ්වසන අවහිරතා සුවකරයි.




රූපාවලිය අංක 6 - මිණිපුර මිණි මියුසියම් මැණික් ලිත

ග්‍රහයන් ගැන කියවෙන කවි වල පවා ඔවුන්ට අයත් මැණික් ගල් ගැන සඳහන් වේ.

ඉඳුරු දික්පති සහස බරණැසි රක්තවන් හිමි වූ — නිමල්
මියුරු බොජුනට කොකුම් සහ බත් මෙන් ම ගත යුතු පත් — ඉඹුල්
සොඳුරුවන් ඇති පියුම්රාමිණි තමන්ට ම හිමි රත්න — ගල්
නපුරු උවදුරු දුරැර දිවයුරු පැහැර සරසන් සුබ — මඟුල්

කුජ ග්‍රහයා වෘශ්චික රාශියේ ගමන් කරන විට භූමි ලාභ ගෙන දෙන බවත් එය මැණික් ගරන්නන්ට වාසිදායක ග්‍රහ යෙදුමක් බවත් ජ්‍යොතිශවේදීන්ගේ අදහසයි.

අපල සඳහා යොදා ගන්නා මැණික් ගලක් අවම වශයෙන් කැරට් 2ක් වත් බර තිබිය යුතු ය.[3] ඉපැරණි ග්‍රීක විශ්වාස වල තිබූ පරිදි මුතු ඇටයක් කුඩු කර එම කුඩු තේ හෝ බීම විදුරුවකට දමා බීමට දීමෙන් පෙම්වතුන්, පෙම්වතියන් වශී කර ගත හැකි ය.[4]

ග්‍රහ අපල සඳහා කළ හැකි සරල ශාන්තිකර්මයක් ලෙස මැණික් පැළඳීම දැක්විය හැකි ය. අපලයක් උදා වන්නේ යම් ග්‍රහයෙකුගේ කිරණ ජන්මියා කෙරෙහි දුර්වලව බලපාන විට ය. එම ග්‍රහ කිරණ උරාගෙන ඇති මැණික් ගලක් පැළඳීමෙන් දුර්වල වූ හීන වූ ග්‍රහ කිරණ තම ශරීරයට ලැබීමට සැලැස්විය හැකි ය.

ඒ අනුව සමස්තයක් වශයෙන් සැලකූවිට මැණික් කර්මාන්තය තුළ එයටම ආවේණික ඇදහිලි හා විශ්වාස අන්තර්ගතවන අතර, අතීත මුතුන්මිත්තන් තුළ මෙම අභිචාර ඉතා ඉහළ මට්ටමක පැවතිනි. වර්තමානයේ බොහෝ පාර්ශවයන් අතර ඒවා භාවිත වේ. සුළු පාර්ශවයක් පමණක් එහි වටිනාකම අවතක්සේරුවට ලක් කරයි. මෙහි දී වර්තමානය තෙක් කරුණු සලකා බැලීමේ දී මැණික් කර්මාන්තය හා සැබැඳුණු මෙම අභිචාර විවිධ වෙනස්කම්වලට ලක් වී ඇතිබව ද පෙනේ. එසේම නවීන තාක්‍ෂණය හා වානිජකරණය හමුවේ අතීතයේ සිට පැවති මැණික් කර්මාන්තය හා සැබැඳුණු ඇදහිලි හා විශ්වාස තුළ යම්කිසි අඩාල වීමක් ද මෙම ක්ෂේත්‍ර ගවේෂණයේ දී හඳුනාගැනීමට හැකිවිය. ඒ අනුව ඓතිහාසික මෙන්ම කාලීන වටිනාකමක් සහිත වූ මෙම අග්‍රගණ්‍ය මැණික් කර්මාන්තය හා ඒ ආශ්‍රිතව පවතින ඇදහිලි හා විශ්වාස මැනවින් ආරක්‍ෂා කරගැනීම අනිවාර්යය කාර්යයක් බව මින් පැහැදිලිය.

*[3] කොඩිකාර, එස්. (2004, සැප්තැම්බර්. 20වන දින). මැණික් ගලේ සැඟවුන රහස්. දිවැස පත්‍රය, අවසාන කොටස, කොළඹ වාසනා ප්‍රකාශනය.*

*[4] ගුණතිලක, කේ. (1997, ජූනි 04). මුතු මැණික්වලින් ගෙන එන ගුප්තමය වාසනා බල මහිමය. තාරකා. 08, 09 පිටු*

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


ආරියරත්න, ඩී. එච්. 1977. *ශ්‍රී ලංකාවේ මැණික්,* කොළඹ: ගුණසිරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ඒකනායක, එච්. ඒ., ඇකිරියගල. 2006). *රොබට් නොක්ස් දුටු ලක්දිව.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහටපිටිය, එල්. 1972. *ජන කවි රටා.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කුරේ, පී. ජී., රූපසිංහ, එම්. 2003. *අප අවට මිහිතලය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කවිතිලක, කේ. කේ. එම්. වර්ෂය සඳහන් නොවේ). *රත්න පරීක්ෂක ශාස්ත්‍රය.* කේ. ඇම්. සමයවර්ධන යන්ත්‍රාලය.

කාරියවසම්, ටී. 1994. *බහිරව පූජා විමර්ශනය.* කොළඹ: තරංජි ප්‍රින්ටර්ස්.

චන්ද්‍රජෝති, එම්. 1992. *ලංකාවේ මැණික්.* කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

ජයකොඩි, පී. 2004. *පිලීතියස් දුටු ලංකාව.* දයාවංශ ජයකොඩි සහ සමාගම.

ජයසේන, බී. එන්. ආර්. 2007. *බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය කෘතිය.* කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

ජයවර්ධන, එස්. එච්. වී. ජී. 1996. *ජනකාව්‍ය මඤ්ජරී.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවර්ධන, එස්. එච්. වී. ජී. 1999. *සිව්හෙළ ජනප්‍රවාද.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයමහ, පී. බී. 1990. *බලංගොඩ මානවයා.* සාම ප්‍රකාශන.

ඤාණවිමල, කේ. 1967. *සබරගමු දර්ශනය.* රත්නපුරය: ශාස්ත්‍රෝදය යන්ත්‍රාලය.

ඤාණවිමල, කේ. 1946. *සබරගමුවේ පැරණි ලියවිලි.* කොළඹ: ලෝකෝ යන්ත්‍රාලය.

තිස්ස, කේ., ආනන්ද. 1992. *සිංහල සන්නස් හා තුඩපත්.* සාර ප්‍රකාශන.

දනන්සූරිය, ජී. 2002. *ජනශ්‍රැති අධ්‍යයනය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, එම්. 1996. *දෙමළ හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම.* වැල්ලම්පිටිය: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය.

නා ඔටුන්න, කේ. 1986. *පොළවේ සම්පත්.* රත්නපුරය: සෆයර් ශ්‍රී ලංකා ප්‍රකාශන.

නා ඔටුන්න, කේ. 1986. *භූගර්භයේ සැඟවුණු මැණික්.* රත්නපුරය: සෆයර් ශ්‍රී ලංකා ප්‍රකාශන.

නොක්ස්, ආර්., ඩේවිඩ්, කේ (අනු). 1989. *එදා හෙළදිව (තුන්වන මුද්‍රණය),* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පත්බේරිය, පී. 2004. *මැණික් ලෝකය.*

පොන්නම්පෙරුම, ඩී. පී. 1961. *විදේශිකයන් දුටු පුරාණ ලංකාව*, මහනුවර: ආර්ය මුද්‍රණාලය.

පල්ලියගුරු, සී. 2005. *ජනශ්‍රැතිය පුරා කතාව හා පුරාවෘත්තය.*

පාකර්, එච්., පෙරේරා, කේ. එස් (පරි). 2006. *ගම්මැද්දේ ජන කතා තෙවැන්න නිල් දිය ලිඳේ කුමාරි කතාව සහ තවත් සිංහල ජන කතා.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, එන්. 2008. *පුරාණ ලංකාව.* කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පෙරේරා, ජේ. 1853. *හෙළදිව රජනිය හෙවත් පුරාතනය පටන් දැන් දක්වා සිංහල ද්විපයේ රජ නීතිය.* වැසිලියන් මිසියෝ නාරිස් උන්නාන්සේලාගේ පොත් අච්චු ගසන ස්ථානයේ දී.

ප්‍රනාන්දු, එම්. 1992. *මැණික් හඳුනා ගැනීම.* දෙහිවල: සරණ මුද්‍රණාලය සහ ප්‍රකාශන.

මහේන්ද්‍ර, එස්. 2000. *ජන කියමන් පොත.* කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Moundevile, John. 1727. *The Vayage and Travale of Sri John Moundevile*. No other data available.

රාජපක්ෂ, එස්. 2000. *මැණික් කර්මාන්තය හා බැඳි චත්පිළිවෙත්.* කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, ඊ. එම්. 1996. *සමන්ත කූටය ශ්‍රී පාද ස්ථානය හා ජනශ්‍රැති.* වැල්ලම්පිටිය: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, චතුර මුද්‍රණාලය.

රත්නපාල, ඊ. එම්. 1996. *කළුගඟ අසබඩ,* වැල්ලම්පිටිය: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, චතුර මුද්‍රාණාලය.

රත්නපාල, ඊ. එම්. 1999. *ලක්බිමේ මැණික්.* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

රත්නපාල, එන්. 1995. *ජනශ්‍රැති විද්‍යාව.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රූපසිංහ, එම්. එස්. 2000. *ශ්‍රී ලංකාවේ ගෙවුඩ.* මහරගම: තරංජි ප්‍රින්ටස්.

ලියනගේ, බී. 2000. *රත්නපුර ජනප්‍රවාද.* විශ්වලේඛ ප්‍රකාශකයෝ.

ලියනගේ, බී. වර්ෂය සඳහන් නොවේ). *සබරගමුවේ ජන කවි,* පන්නිපිටිය: තිලක් ප්‍රින්ටින් ප්‍රයිවට් ලිමිටඩ්. රත්නපාල, ඊ. ඇම්. 1999. *ලක්බිමේ මැණික්,* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

වනිගරත්න, ඩබ්ලිව්. ඒ. 1976. *මූලික රත්න විද්‍යාව හා මැණික් කර්මාන්තය.* කොළඹ: සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.

විමල්, ජී. බී. 1999. *ෆාහියන්ගේ දේශාටන වාර්තාව.* බොරලැස්ගමුව: විසිදුණු ප්‍රකාශන.

සමරවික්‍රම, සී. 1994. *කුකුළු කෝරළේ ජන කවි හා ගැමි සංස්කෘතික ලක්ෂණ.* කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිපාල, එන්. 1998. *මාතලේ ජන කවි.* පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.

සිරිපාල, එන්. 1999. *සබරගමු ජන කවියේ සමාජ මුහුණුවර.* පියසිරි ප්‍රින්ටින් සිස්ටම්.

සෝමරත්න, ඒ. එච්. ඇම්. 1967. *ඩේවි දුටු ලංකාව.* සීමාසහිත (පෞද්ගලික) විසිදුණු ප්‍රකාශනයකි.

සිල්වා, ඇස්. ඇස් ද., එරත්න, ඊ. ආර්. 1963. *ලංකාව පරාදීන සමය පරංගි විජිතය අංක 02.* කේ. ඒ. ආරියදාස සමාගම.